වාවකච්චේරි නගර සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 16 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 11 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වාවකච්චේරි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ දෝෂ
---------------------

රු.92,925 ක් වූ කඩ කුලී අත්තිකාරම් හිඟ කඩකුලී ගිණුමට එරෙහිව හිලව් කිරීම හේතුවෙන් හිඟ කඩකුලී රු. 92,925 ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
----------------------------------

ලැබිය යුතු ගිණුම්
-------------------

එකතුව රු.96,668 ක් වූ මියගිය හා ධුරය පැහැරගිය නිලධාරීන් පස්දෙනෙකුගෙන් ලැබිය යුතු හිඟ කාර්යමණ්ඩල ණය අයකර ගැනීම සඳහා පසුගිය වසර 06 තුළ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ගක් ගෙන නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම
----------------------------------

භෞතික පරීක්ෂාව සඳහා අදාළ වත්කම් ඉදිරිපත් නොකිරීම හේතු කොට ගෙන එකතුව රු. 6,072,025 ක්වූ ගිණුම් විෂයයන් පහක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

---------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) නගර සභා ආඥා පනත | |
| (i) VI කොටසේ 157 වගන්තියේ අංක 6(උ) | අනුමත නොකළ දැන්වීම් 55 ක් පිළිබඳ ආදායම් පරීක්ෂක විසින් කටයුතු කර නොතිබුණි. |
| (ii) VI කොටසේ 157 වගන්තියේ අංක 9 | මහජන සෞඛ්‍ය හා සතුට සඳහා වු අවස්ථාවලදී අපජලය හා අපද්‍රව්‍ය එකතු කෙරෙන ස්ථානවල ඒවා ගොඩ ගසා පිරිසිදු කිරීම සිදුකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මුදල් රෙගුලාසි 880 | නිලධාරීයෙකුගෙන් සේවක ඇප තැන්පතු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.37,563,975 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.38,737,070 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 7,204,000 | - | 7,125,455 | 11,075,392 | 8,551,200 | | 7,490,826 | 10,217,661 |
| (ii) කුලී | 23,991,200 | - | 26,409,694 | 870,290 | 25,925,200 | | 23,903,332 | 1,153,178 |
| (iii)බලපත්‍ර ගාස්තු | 783,000 | - | 643,160 | 19,550 | 768,000 | | 804,680 | 74,400 |
| (iv)වෙනත් ආදායම් | 17,762,400 | - | 29,906,367 | 3,889,975 | 15,470,500 | | 25,457,582 | 32,303,012 |
| එකතුව | 49,740,600 | - | 64,084,676 | 15,855,207 | 48,714,500 | | 57,656,420 | 43,748,251 |

2.2.2 වරිපනම් සහ බදු

එකතුව රු.9,447,715 ක් හිඟ වරිපනම් හා බදු අයකර ගැනීම සඳහා පසුගිය වසරක සිට වසර 17 දක්වා කාලය තුළ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.2.3 කුලී

එකතුව රු. 486,229 ක්වූ හිඟ කුලී අයකර ගැනීම සඳහා පසුගිය වසරක සිට වසර 12 දක්වා කාලය තුළ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු

එකතුව රු. 5,300 ක්වූ හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා සභාව විසින් පසුගිය වසර 02 සිට වසර 17 දක්වා කාලය තුල සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.2.5 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

2017 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.4,307,233 ක් සහ මුද්දර ගාස්තු රු. 20,190,277 ක් උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙතින් දිගින් දිගටම ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

පහත සඳහන් කරුණු නිරීක්‍ෂණය විය.

(අ) අත්හැර දැමූ කටයුතු

රු. 573,531 ක් වටිනා කර්මාන්ත යෝජනා ක්‍රම දෙකක්, ආරම්භ කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදී මුළුමනින්ම අත්හැර දමා තිබුණි.

(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක

-------------------------

අතිගරු ජනාධිපතිතුමාගේ යෝජනාවට අනුව මහජනයා දිළිඳුකමින් මුදාගැනීම් වස් 2017 වර්ෂය දිළිඳුබව තුරන්කිරීමේ වසර වශයෙන් ප්‍රකාශයට පත්කර තිබුණි. එනමුත් සභාව විසින් ඒ සඳහා වෙන්කළ රු.200,000 ක මුදලක් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝගීකරගෙන නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

------------------------------

සභාව මානව සම්පත් විධිමත්ව බඳවා ගැනීම සහ යෙදවීම සිදුකර නොතිබු බැව් විගණනයේදී නිරීක්ෂණය වුයෙන් මානව සම්පත් 19 ක් විසින් සම්පූර්ණ කළ යුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

කඩ කාමර 26 ක කොන්ත්‍රාත් කාලය අවසන්ව තිබුණි. එසේවුවද, ඒ සම්බන්ධව නැවත කොන්ත්‍රාත්දීම සඳහා පසුගිය වසරක සිට වසර 08 දක්වාම අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

---------------------------

3.4.1 නඩත්තු හා අලුත්වැඩියා කිරීමට අසමත්වීම

-------------------------------------------

සභාවට අයත් හානියට පත් වාහන තුනක් අලුත්වැඩියා කර භාවිතා කිරීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4.2 වත්කම් භාරදීමට අසමත්වීම

----------------------------

සභාව විසින් භාවිත වාහන දෙකක් සභාවට අයත්වී නොතිබුණි.

3.4.3 ඌන උපයෝජිත වත්කම්

----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් වාහන දෙකක් භාවිතාවෙන් තොරව නිශ්කාර්යව පැවතුණි. එසේවුවත් එම වාහන භාවිතයට ගැනීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) කච්චායි මුහුදු වෙරළේ ළමා උයනක් තැනීම සඳහා උතුරු පළාත් ඉඩම් කොමසාරිස් වෙතින් ලබාගත් ඉඩමක් පසුගිය වසර දෙක පුරාම අපේක්ෂිත කටයුක්ත සඳහා යොදාගෙන නොතිබුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය

----------------------------------

අයවැය පාලනය

-----------------

අයවැය ගත ආදායම් සහ තත්‍ය ආදායම් අතර රු.78,545 සිට රු. 10,923,997 හෙවත් සියයට 1 සිට සියයට 21 දක්වා අයවැගත වියදම් හා තත්‍ය වියදම් අතර රු. 52,277 සිට රු.10,707,269 හෙවත් සියයට 05 සිට සියයට18 දක්වා වූ පරාසයක විචලන නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්‍ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | අඩුපාඩු |
| --- | --- |
| ගිණුම්කරණය | ඉඩම් විකුණුම මත බදු ලේඛනය සහ පරිගණක නඩත්තු ලේඛනය නඩත්තු කිරීමට අසමත්වීම. |